**කොවිඩ් -19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතිය - 2022**

**---------------------------------------------------------------------------**

**කොවිඩ් -19 එන්නත් ප්‍රතිචාරාත්මක ප්‍රතිසාධන ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2021 ජූලි 09 දිනැතිව ඇති කර ගත් අනුපිළිවෙළින් අංක 4083-SRI සහ අංක 4084-SRI දරන ණය ගිවිසුමේ 4.02 වගන්තියේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**

**ව්‍යාපෘතියේ** ණය ගිවිසුම්වලට අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය **ව්‍යාපෘතියේ විධායක** නියෝජිතායතනය වන අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහයෝගය/ සහභාගිත්වය ඇතිව සෞඛ්‍ය අමාත්‍යාංශය **ව්‍යාපෘතියේ** ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. සාමාන්‍ය එන්නත් සේවාව සහ අනෙකුත් සෞඛ්‍ය සේවා වලට හානියක් සිදු නොවන පරිදි **කොවිඩ් -19** ට එරෙහිව ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා ජනගහනය සඳහා සුරක්ෂිතව එන්නත් ලබා දීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම්වලට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 32,370 කට සමාන එජඩො මිලියන 161.85 ක් වූ අතර ඉන් රු. මිලියන 30,000 කට සමාන එජඩො මිලියන 150 ආසියානු **සංවර්ධන** බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ විය. ඉතිරි මුදල වන රු. මිලියන 2,370ක් මූල්‍යකරණය කිරීමට **ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි.** ව්‍යාපෘතියේ කටයුතු 2021 අගෝස්තු 19 දින ආරම්භ කරන ලද අතර 2024 **ජූනි** 30 වන විට ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට සැලසුම් කර තිබුණි.

**1.3 තත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2022 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එහි මුදල් ප්‍රවාහයන් පිළිබඳ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.4 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගනන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුනු පිලිබඳවපාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

# 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරන අඩුපාඩුව / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| 2013 නොවැම්බර් 29 දිනැති අංක 230/2013 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව, ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතු නමුත්, පොලී සහ බැඳීම් ගාස්තු පිළිවෙලින් රු.මිලියන 114.5 සහ රු.මිලියන 8.3 ගිණුම්ගත කර නොතිබුණි. | ව්‍යාපෘති පරිපාලන අත්පොතේ 15 වැනි වගුවට අනුව, 4083 යටතේ පොලී සහ කැපවීම් ගාස්තු ප්‍රාග්ධනීකරණය කිරීම අවශ්‍ය නොවේ. | රෙගුලාසිවලට අනුකූල විය යුතු අතර ණය ගැනීමේ පිරිවැය ප්‍රාග්ධනීකරණය කළ යුතුය |

**2.2 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

| නීතිරීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම / විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| 2019 මාර්තු 05 දිනැති අංක 1/2019 දරනකළමනාකරණ සේවා චක්‍රලේඛයේ 9.3 වගන්තිය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව අවම වශයෙන් මාස දෙකකට වරක් රැස්විය යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය තුළ එක් වරක් පමණක් කමිටුව රැස්වී තිබූ අතර ඒ සඳහා සාමාජිකයින් 13 දෙනෙකුගෙන් පැමිණ සිටියේ 5 දෙනෙකු පමණි | සමාලෝචනය කිරීමට කිසිදු ක්‍රියාකාරකම් නොමැති බැවින් ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීමක් පමණක් පැවැත්විය හැකි වූ අතර විවිධ හේතූන් මත සංවිධානය කර තිබූ තවත් කමිටු රැස්වීමක් අවලංගු කිරීමට සිදු විය. | රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |

**3. භෞතික කාර්යසාධනය**

**3.1 නිෂ්ක්‍රිය සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| රු.මිලියන 2,499 ක් වටිනා සිනෝෆාම් එන්නත් මාත්‍රා1,784,684 ක් වසංගත රෝග විද්‍යා දෙපාර්තමේන්තුවේ මධ්‍යම එන්නත් ගබඩාවේ ගබඩා කර ඇති අතර ඒවා 2023 ජූලි 08 සහ 2023 අගෝස්තු 24 දිනයන් වලදී කල් ඉකුත් වේ. | අත්සන් කරන ලද ණය ගිවිසුමට අනුව, එන්නත් මාත්‍රා 03 ක් ලබා දීමෙන් ජනගහනය මිලියන 04 ක් ආවරණය කිරීමට සැලසුම් කර ඇතත්, අපේක්ෂිත පරිදි එන්නත් කිරීමට ජනතාව ඉදිරිපත් නොවීම නිසා මුළු එන්නත් ප්‍රමාණයම ප්‍රයෝජනයට ගැනීමට නොහැකි විය. කෙසේ වෙතත්, මධ්‍යම එන්නත් ගබඩාවේ ඉතිරිව ඇති එන්නත් තොග සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස වසංගත රෝග විද්‍යා අංශයේ ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥවරයාට උපදෙස් ලබාදී ඇත. | එන්නත් තුනම ලබා ගැනීමට ජනතාව පෙළඹවිය යුතුයි |

**3.2 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වාහනයක් කුලියට ගැනීමේ කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාට වාහනය අවම වශයෙන් මසකට කිලෝමීටර් 2000ක් භාවිත කළ යුතු අතර මාසික කුලිය රු. 155,000 කි. කෙසේ වෙතත් 2022 ජනවාරි මස හැර අවම කිලෝමීටර් ප්‍රමාණය ධාවනය කර නොතිබුණි. | Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් සංචරන සීමා කර නිවසේ සිට වැඩ කිරීමට අවසර ලබාදී තිබූ බැවින්, සැලසුම් කළ පරිදි ව්‍යාපෘති කටයුතු සිදු නොවීය. ඒ නිසා බලාපොරොත්තු වූ කිලෝමීටර් ප්‍රමාණය ධාවනය කිරීමට නොහැකි විය. | ප්‍රායෝගික තත්ත්වයන්ට ගැළපෙන පරිදි ගිවිසුම්වලට වගන්ති ඇතුළත් කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | ටෙන්ඩර් ලියකියවිලි වල සේවා විෂය පථයේ ඇමුණුම A අනුව වාහනයට රියදුරෙකු සැපයිය යුතුය. WP CAO-2837 දරන වාහනයේ ධාවන සටහනට අනුව ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා රියදුරු නොමැතිව කිලෝමීටර් 3,004ක් වාහනය භාවිතා කර තිබුණි. | වාහනයට රියදුරෙකු සපයා ඇතත් සති අන්ත සහ නිවාඩු දිනවල රියදුරෙකුගේ සේවය ලබා ගන්නේ නම් අමතර දීමනා ගෙවීමට සිදුවේ. සති අන්ත සහ නිවාඩු දිනවල ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවූවත්, එහි ගිවිසුම්ගත සේවාවන් යටතේ ආරක්ෂක සේවය ක්‍රියාත්මක විය. තවද, ගොඩනැගිල්ලේ වායු සමීකරණ ඇතුළු අනෙකුත් නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සති අන්ත සහ නිවාඩු දිනවල සිදු කෙරෙන අතර ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා මෙම වැඩ කටයුතු අධීක්ෂණය සඳහා එම වාහනයම භාවිතා කර ඇත. | ප්‍රායෝගික තත්ත්වයන්ට ගැළපෙන පරිදි ගිවිසුම්වලට වගන්ති ඇතුළත් කළ යුතුය |